## ඇත්ත කෙටි කතාව

# සූවස් ඇල ළඟදී මරණයෙන් බේරීම




**ඒ** දැනට අවුරුදු දහයකට පමණ පෙර අගෝස්තු නිවාඩුවයි. මිසරයේ පිරමිඩ් දැකගන්නට කලක් තිස්සේ බොහෝ ආශාවෙන් සිටි මාත්, බිරින්දැත්, දියණියන් දෙදෙනාත් වසර තුන් දහසකටත් වඩා පැරණි නටබුන් අතර දින දහයක සංචාරයකට මුල පුරමිනි. එහිදී අත්දුටු දේ අතර තවමත් මගේ මතකයෙන් බැහැර කළ නොහැකි සිද්ධීන් කීපයක් වෙයි. එයින් ප්‍රධාන වන්නේ සූවස් ඇළ අයිනේදී අපට මරණයෙන් බේරීමට හැකිවීමයි. එය සිදුවූයේ මෙසේ ය.

සූවස් ඇල බැලීමට පුල පුලා සිටි අප දිනක් උදෑසන සංචාරක මග පෙන්වන්නෙකුද කැටුව කුලී රියකින් සූවස් ඇල කරා ගමන්ගත්තෙමු. වටපිටාව බැලීමට තරම් නොහැකි තද අව් රශ්මියෙන් යුතු කාන්තාර පෙදෙස පසුකරමින් අපි මධ්‍යාහනය වන විට සූවස් ඇල කරා පැමිණ සිටියෙමු. එය අලංකාර දසුනක් වීය. එය මට පෙනුණේ නිසි ලෙස කැපූ විශාල වතුර කාණුවක් පරිද්දෙනි. අප ළඟාවූ හරියේ මුර කුටියක්ද, මුරකරුවෙක්ද විය. අප මග පෙන්වන්නා ඔහුගෙන් දැනගත් පරිදි නැවක් සූවස් හරහා යාමට තව පැය දෙකක් පමණ ඇත්තේය. සූවස් ඇලේ ගමන්කරන නැවක් බැලිය යුතු වුවත් තව පැය දෙකක් ඒ සඳහා මේ අමු කාස්ටක අව්වේ කෙසේ ගත කළ හැකිදැයි අප හතර දෙනා අතර තර්ක විතර්ක විය. අවසානයේ අප තීරණය කළේ නැවක් නොදැකම ආපසු හෝටලයට යාමටයි.

බිරිඳ ලොකු දියණිය සමග වාහනයට ගොඩවූ අතර, මම කුඩා දියණියත් සමග තව පින්තූරයක් දෙකක් ගන්නට මාන බැලූයෙමි. පුදුමයෙකි එක්වරම ඉතා විශාල නෞකාවක් අප ඇස් ඉදිරියෙන්ම ඇල හරහා යමින් තිබිණ. කලබල වූ මම නැව පසුතලයට තබා දියණියගේ ඡායාරූප කීපයක් ගතිමි. එමෙන්ම කැමරාව උඩට හරවා නැවේ ඡායාරූප කීපයක්ද ගත්තෙමි. එක්වරම අපට මහා කෑගැසීමක් ඇසිණ.

සූවස් ඇල හා සමගාමීව තිබෙන මාර්ගයෙහි අප ඉදිරියෙන් තුවක්කු ලෙලවමින් හටයන්ගෙන් පිරී හමුදා රථ දෙකක් එයි. ඔව්හු අරාබි බසින් බෙරිහන් දෙති. ඇල මුරකිරීමට සිටි මිනිසා වහා ඉදිරියට පැන අප දෙදෙනා මුරකුටිය ඇතුළට ඇද ගත්තේය. වේගයෙන් ආ එම වාහන අප පසුකරමින් නැවේ වේගය සැසැඳීමට මෙන් වේගයෙන් හඹාගෙන ගියේය. නැව ඈතට යද්දී එහි උඩුමාලයේ සවිකර තිබූ කාලතුවක්කු වලින් එම නැව යුද්ධ නෞකාවක් බව ප්‍රත්‍යක්ෂ විය. ඒ විගසම කුටියෙන් එළියට ආ මුරකරු අප මගපෙන්වන්නාට ගයිඩ් ට අරාබි භාෂාවෙන් බැනගෙන බැනගෙන ගියේය. ඔහුගේ ස්වරය කොතරම් උච්ච වූවාද යත් අහල පහල සිටි කීප දෙනෙකු වැඩ නවත්වා අප දෙස බලාගෙන සිටියෝය. ඇටිකෙහෙල් කෑ උගුඩුවකු මෙන් නිහඬව සිටි අප මාර්ගෝපදේශකයා වචනයක්වත් නොදොඩා අපත් සමග වාහනයට නැග හිස බිමට බරව හෝටලය කරා ගමන්ගත්තේය. දරුණු යමක් සිදුවන්නට ගොස් ඇති බව අපට අවබෝධ විය. අප මරණයට ආසන්නව බේරී ඇති බව තේරුම්ගියේ අප නැවතී සිටි හෝටලයේ කළමනාකරුට සිද්ධිය පිළිබඳව පැවසීමෙන් අනතුරුවය.

අප ඡායාරූප ගෙන තිබෙන්නේ යුද්ධ නෞකාවකය. එම නෞකාව ආරක්ෂා කිරීමට ගොඩබිමින් යුදහමුදා වාහන ගමන් කෙරේ. එකල ඒ රටේ තිබූ වාතාවරණයට අනුව එවන් නැවක පින්තූරගැනීම වෙඩි කෑමට සිදුවිය හැකි ක්‍රියාවක් බවත්, එසේ වෙඩි තැබූ පසු ඒ අසලම වලක් හාරා වළ දැමීමට සිදුවිය හැකි බවත් ඔහු පැවසුවේ අප ශරීරයේ ලෝමයන් කෙලින් සිටුවමිනි. ඒ කතාවේ යම්තාක් දුරට ඇත්තක් ඇතැයි සිතෙන්නේ සූවස් ඇලේ මුරකරු අප මාර්ගෝපදේශකයාට බැණවැදුණු ආකාරය දැන් සිහිවන විට ය.

♦ **නීතිඥ අනුර හෑගොඩ**
**London**

## The law of the Garbage Truck
## කුණු ලොරියේ න්‍යාය

**by David J Pollay - USA**



One day in New York, I hopped in a taxi and we took off for the airport.

We were driving in the right lane when suddenly a black car jumped out of a parking space right in front of us.

My taxi driver slammed on his brakes, skidded, and missed the other car by just inches! The driver of the other car whipped his head around and started yelling at us.

My taxi driver just smiled and waved at the guy. And I mean, he was really friendly.

So I asked, " Why did you just do that ? This guy almost ruined your car and sent us to the hospital ! "

This is when my taxi driver taught me what I now call, '**The Law of the GarbageTruck.**'

He explained that many people are like garbage trucks. They run around full of gar-bage, full of frustration, full of anger, and full of disappointment, full of unsecured feeling.

As their garbage piles up, they need a place to dump it and sometimes they'll dump it on you. Don't take it personally.

Just smile, wave, wish them well, and move on. Believe me. You'll be happier."

Don't take their garbage and spread it to other people at work, at home, or on the streets."

The bottom line is that successful people do not let garbage trucks take over their day.

Life's too short to wake up in the morning with regrets. So ... Love the people who treat you right. Wish for the ones who don't.

**දි**නක් නිව්යෝර්ක් නගරයේ දී මම ගුවන්තොටුපළට යෑම සඳහා කැබ් රථයකට නැගුණෙමි. අප නිවැරදි ලේන් එකේ ඉදිරියට යමින් සිටියදී හදිසියේම පාර අයිනේ නවතා තිබූ කළු පැහැති කාර් එකක් අප ඉදිරියෙන් පාරට දැම්මේය. මගේ කැබ් රථයේ රියැදුරා ක්ෂණිකව බ්රේක් පාරක් ගැසූ නිසා සිදුවන්නට ගිය විශාල අණතුරෙන් නූලෙන් බේරෙන්නට හැකිවිය. එහෙත් මා වඩාත් විමතියට පත් කළ කරුණ නම් වරද කළ ඒ කාර් කාරයා වීදුරුව පහත් කොට මගේ කැබ් රථයේ රියැදුරාට මහ හඬින් නොසරුප් බසින් බැණ වැදීමයි.

මගේ කැබ් රථයේ රියැදුරා කළේ බනින කාර්කාරයාට සුහද සිනාවකින් සංග්‍රහ කරමින් අත වනා ආචාර කිරීමයි. එසේ කළේ ඇයි දැයි මම ඇසුවෙමි. කුණු ලොරියේ න්‍යාය ඔහු මට එදා කියා දුන්නේය. ඔහු කීවේ මෙයයි.

" කුණු ලොරි කරන්නේ හැම තැනම පාරවල්වල ගිහින් කුණු එකතු කරන එක. හවස් වෙන කොට ලොරියෙ කුණු පිරිලා. ඒ පාර ඒව කොහේ හරි හලන්න බල නවා. සමාජෙ හුඟක් දෙනා කුණු ලොරි වගෙයි. තරහෙන් කළකිරීමෙන් බලාපොරොත්තු සුන්වීමෙන් සහ සුරක්ෂිතකමක් නැතුව ඉන්න පිරිසක්. මොකටද අපි ඒ කුණු බාර ගන්නෙ? බාර අරගෙන ගෙදර හෝ අපි වැඩකරන තැනට හලන්නෙ ? "

" කිසිකෙනෙක් එක්ක තරහ වෙන්න ඕන නෑ. බනින කෙනාටත් සුහද හිනාවකින් පිළිතුරු දෙන්න. එතකොට කුණු බිංදුවක්වත් නැතුව ඉතා සුන්දරව දවස ගෙවෙනවා."

*මෙම ලිපිය එව්වේ -*

♦ **මහල් රත්නසිරි**
**London NW6**



## පොල් බූරුවන්ගේ දේශය



***අවුරුදු දෙකකට පෙර ශ්‍රීලංකාවේ විපක්ෂය මුන්නේස්වරම් කෝවිලට ගොස් දැන් පවතින රජය වැටෙන්නටය කියා එතැන ගලේ ගසන ලද එක දවසක පොල් ගොඩය මේ.***

**බ**යිලා චක්‍රවර්ති එම්. එස්. ප්‍රනාන්දු ගායකයාණන්ගෙ ජනප්‍රිය සිංදුවක් මට මතක් වුණා. ඒකෙ මෙහෙම තියනවා.

*පොල් පොල් පොපොල් පොල් පොල් පොල් .......*
*ලංකාවෙ වතුවල වැවෙන පොල් .......*
*පොල් පොල් පොල් .......පිටරට පටවන පොල් .......*
*කුරුම්බ ගෙඩියක් බිව්වම -ඒකෙ ලොදේ සූරගෙන කෑවම*
*බඩකට පිරෙනව මහන්සි ඇරෙනව -දන්නවාද මැගි අක්කේ ?*

එම්. එස්. පිටිසර උපන් කෙනෙක් නෙවෙයි. ගල්කිස්සෙ උපන් නාගරිකයෙක්. ඒත් ඔහු පොල්ගහේ අගේ දන්නවා. පොල් ගහ ගැන සිංදුවක් හදපු එකම ගායකයා ඒ අපේ එම්. එස්. ඔහු කීවේ කල්පවෘක්ෂය හෝ කප්තුර යනුවෙන් හඳුන්වන පොල්ගස හා එහි ප්‍රයෝජන ගැනයි. **කප්තුර** යනු දිව්‍යලෝකයේ ඇති ඉල්ලන කෙනෙකුට සිතූපැතූ සම්පත් දෙන ගසයි. පොල් ගහ ලංකාවට කප්තුරක් වගේ. ප්‍රයෝජන බොහොමයි. ඒකෙ වීසි කරන්න කිසිම දෙයක් නැහැ. ගෙඩි, මල්, අතු, කෙඳි, කඳ ඔය ආදී හැම දෙයක්ම ප්‍රයෝජනවත් නිසාත්, ඒක ලංකාවෙ බහුතර යකගෙ බඩගින්න පිපාසය නිවා, ඉහට සෙවන සාදා දෙන නිසයි කප්තුර කිව්වෙ. පොල්කිරි අපේ ඉවුම් පිහුම් වලට නැතුවම බැහැ. කොටින්ම පොල් නැත්නම් ලංකාවෙ ජන ජීවිතය ඉවරයි.

ලංකාවෙ පොල් ගෙඩියක් ගිය මාසෙ රුපියල් 50 ටත් එහා ගියා. ඒපාර ඇමති ජොන්ස්ටන් කේරළයෙන් පොල් ගෙන්නුවා. ඒවා රුපියල් 30 ට දෙනවයි කියනවා. පොල් පිටරටින් ගේන තත්වෙට ලංකාව වැටුණෙ කොහොමද කියලා කිසි කෙනෙක් හොයල බලන්නෙ නැහැ. පොල් දැන් එන්න එන්නම හිඟවෙනව. දැන් පොල් හිටවන්නෙත් නැහැ. තියන පොල් ඉඩම්, කෑලිවලට කඩල ගෙවල් ගහන්න විකුණනවා. ඔය කුරුණෑගල පැත්තෙ තිබ්ච්ච පොල් ඉඩම් සේරම අරං ගස්ටික කපලාදාලා ඉඩම් කෑලි වලට කඩල විකුණන පවුල් ඉන්නවා. උන්ට එහේ මිනිස්සු කියන්නෙ පොල්කුරුමිණියො කියලා. ඒ පොල් කුරුමිණියො පස්සෙ කාලෙක මන්ත්‍රීවරු ඇමතිවරු පවා වුණා. තවමත් ලංකාවෙ මන්ත්‍රීලට ඇමතිලට ස්ටේජ් ගහන්න පොල් ගස් කපල විනාස කරනවා. කුරුමිණියො කාලා දාස් ගණනක් පොල් ගස් මැරෙනව. පෝර නැතුව කණාටුවෙලා මැරිලායනවා. ලංකාවෙ ආර්ථිකයෙ කොටසක්ව තිබුණු පොල් වගාව දැන් පණ අදිනව.

ගෙදර කන්න පොල් නැතිවුණාට ලංකාවෙ මෝඩ ජනමනයා රුපියල් හතළිහ, පණහ දීලා පොල් අරගෙන කතරගම, වැල්ල වත්තෙ, හලාවත කෝවිල්වලට ගිහිං අර පොල් ටික ගලේ ගහලා කුඩුකරනවා. ලංකාවෙ විපක්ෂය නිතර ඔය පොල් බූරු වැඩේ කරනවා. මේ මෑතකත් ඒ ගොල්ල ආණ්ඩුව වැටෙන්න කියලා කරත්තෙකින් එකක් පොල් අරං ගිහිං මුන්නේස්වරම් ගලේ ගහලා බින්දා. දෙයියො ඒව අහන පාටක් නැහැ. කොහොමත් ඔය වෙලාවට දෙයියො ඉන්නවා ඇත්තෙ සෑහෙන ඈතට වෙලා. බැරිවෙලාවත් ඔය ගහන පොල් ගෙඩියක් විසි වෙලා ඇවිල්ලා ඇහේ වැදුණොත් දෙයියොයි කියලා නැහැ තුවාල වේවි.

පොල්ගැහිල්ල ඇතිවුනේ හින්දු මිත්‍යා කතාවකින්. ඊශ්වර දෙවියන්ට අසුරයෙක් සාපකළා හිස හත්කඩකට පැලෙන්න කියලා. ඊශ්වර බයවෙලා තම ලොකු පුතා සහ මොළකාරයා වන ගණදෙවියන් ළඟට දිව්වා. ලොකුපුතා උපක්‍රමයක් කිව්වා. " තාත්තේ, පොල්ගෙඩියක් ඔළුව උඩ තියාගෙන වතුරෙ ගිලිලා ඉන්න. පොල්ගෙඩිය විතරක් උඩට පේන්න." ඊශ්වර එහෙම කළා. අසුරයා සාප කළාම ඒක වැදිලා පොල්ගෙඩිය කුඩුවුණා. නමුත් ඊශ්වරගෙ ඔළුව බේරුණා. ඒ සිද්ධිය සැමරීම තමයි ඔය පොල් ගැහිල්ල. හින්දුකාරයො පොල් ගහන්නෙ අන්ධ විස්වාසෙට. ඒත් ලංකාවෙ වැඩියම පොල් ගහන්නෙ බෞද්ධයො. ඊශ්වරයා ඔලුව බේරගත්තෙ පොල්ගෙඩිය නිසා. බෞද්ධයා පොල් ගහන්නෙ ඔලුව නැතිකමට. තනිකරම ගොන්කමට. පොල් ගහලා ලැබිච්ච දෙයක් තියනවද? අනේ කවදද මුන්ගෙ මොලේ පෑදෙන්නෙ ?

ඔය වගේ අන්ත තකතිරු ගොන් වැඩ කරලා, පොල් ටික විනාස කරලා, අර දුප්පත් කේරළේ තියන පොල් ටික දිහා දැන් ලංකාව බලාගෙන ඉන්නවා. අනිච්චේ...! දුක්ඛෙ....!

♦ **වෙලේගෙදර රාළ London**